# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## 4.8 පාලන ගිණුම්



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

# නිපුණතා මට්ටම 4.8 –


# පාලන ගිණුම් හා උප ලෙජර් අතර සම්බන්ධතාව දක්වයි

## පාලන ගිණුම්

### පාලන ගිණුම් තැබීමේ අවශ්‍යතාව :-

ගනුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට ගිනුම් තැබීමේදී එම ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා පොදු සම්මත ආකෘතිය ගිණුම වේ . මෙම ලෙජර් ගිනුම් ඒකරාශී වී ඇති ස්ථානය ලෙජරය( පොදු ලෙජරය) වේ. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු සංඛ්‍යාව අධික වන විට ලෙජරය තුළ ඇතුළත් වන ගිනුම් සංඛ්‍යාව ද අධික වේ. බොහෝ ව්‍යාපාර ණයට ගැනුම් සහ ණයට විකුණුම් සිදු කරන නිසා සෑම ගනුදෙනුකරුවකු වෙනුවෙන්ම පෞද්ගලික ගිණුමක් ද පොදු ලෙජරය තුළ තබා ගැනීමට සිදුවේ. ඒ නිසා ඇතිවන දුෂ්කරතා අවම කිරීම සඳහා ව්‍යාපාර පොදු ලෙජරයට අමතර ව උපයෝගී ලෙජර/උප ලෙජර/අනු ලෙජර පවත්වාගෙන යන යනු ලැබේ.

### ලෙජරය වර්ග කිරීම




## පොදු ලෙජරය

ගිණුම් තැබීමේ දී භාවිතා කරන වත්කම් ,වගකීම්, ආදායම් ,වියදම් ,හිමිකම් යන ඕනෑම වර්ගයක ගිණුම් ඇතුළත් ලෙජරය පොදු ලෙජරය වේ. ඕනෑම ආයතනයක් විසින් සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන ලෙජරය පොදු ලෙජරයයි.

## උප ලෙජර් /උපයෝගී ලෙජර්

ආයතනයක එකම වර්ගයේ ගිනුම් වර්ග රාශියක් පවතින විට එම එක සමාන ලෙජර් ගිනුම් සමූහය පමණක් ඇතුළත් කරමින් පොදු ලෙජරයට අමතරව පවත්වාගෙන යන යනු ලබන ලෙජර් උප ලෙජර් ලෙස හැඳින්වේ.

උදා- ණයගැති ලෙජර් , ණය හිමි ලෙජර්



Copyright © www.e-thaksalawa.moe.gov.lk

### ණය ගැති ලෙජරය

කිසියම් ආයතනයක වෙළඳ ණයගැතියන් විශාල ප්‍රමාණයක් සිටින විට එම වෙළඳ ණයගැති ගිණුම් පොදු ලෙජරයෙහි ඇතුළත් නො කොට, එකී ණය ගිණුම් සියල්ල පමණක් ඇතුළත් කරමින් පොදු ලෙජරය ට අමතර ව සකස් කරන ලෙජරය ණයගැති ලෙජරය වේ.

### ණයහිමි ලෙජරය

කිසියම් ආයතනයක වෙළඳ ණයහිමියන් විශාල ප්‍රමාණයක් සිටින විට එම වෙළඳ ණයහිමි ගිණුම් පොදු ලෙජරයෙහි ඇතුළත් නො කොට, එකී ණයහිමි ගිණුම් සියල්ල පමණක් ඇතුළත් කරමින් පොදු ලෙජරය ට අමතරව අමතර ව සකස් කරන ලෙජරය ණයහිමි ලෙජරය වේ.

### පාලන ගිණුම්

කිසියම් අනු ලෙජරයක පවතින්නාවූ එකම වර්ගයේ ගිනුම් සමූහයක් වෙනුවෙන් පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන තනි ගිණුම පාලන ගිනුමයි.පොදු ලෙජරය තුළ පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් කිහිපයකි.

- ණයගැති පාලන ගිණුම( විකුණුම් ලෙජර් පාලන ගිණුම)
- ණයහිමි පාලන ගිණුම (ගැනුම් ලෙජර් පාලන ගිණුම)
- VAT පාලන ගිණුම
- වැටුප් පාලන ගිණුම

### ණයගැති පාලන ගිණුම

කිසියම් ව්‍යාපාර ආයතනයක් සිය පොදු ලෙජරය ට අමතරව ණයගැති ලෙජරයක් වෙනමම පවත්වාගෙන යන විට එම ණයගැති ලෙජරය තුළ ඇති සියලුම ණයගැති ගිණුම් වෙනුවෙන් පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන තනි ගිණුම **ණයගැති පාලන ගිණුමයි.**

ණයගැති පාලන ගිණුම වත්කම් පිළිබඳ මූලධර්මය අනුව සකස් කෙරේ.
එනම් ණයගැති වටිනාකම වැඩිවීමට බලපාන ගනුදෙනු මෙම ගිණුමට හර කරන අතර, ණයගැති වටිනාකම අඩු වීමට බලපාන ගනුදෙනු මෙම ගිණුමට බැර කරනු ලැබේ.

ණය ගැති පාලන ගිනුම

| | | | |
|---|---|---|---|
| ශේෂය | **** | ශේෂය | ***** |
| ණයට විකුණුම් | **** | ලද මුදල් | **** |
| පමා පොලී අයකිරීම් | **** | ලැබිය යුතු විනිමය බිල් | **** |
| ලද චෙක්පත් අගරු වීම | **** | බොල් ණය | **** |
| දුන් වට්ටම් අහෝසි කිරීම | **** | දුන් වට්ටම් | **** |
| ආපසු ලද බොල් ණය | **** | ආපසු එවුම් | **** |
| ප්‍රති පියවීම | **** | | |
| ශේෂය | **** | ශේෂය | **** |
| | ***** | | ***** |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ණය ගැති පාලන ගිනුම සැකසීම සඳහා තොරතුරු උපුටා ගන්නා මූලාශ්‍ර

- ආරම්භක ණයගැති ශේෂය -පොදු ජ නලය
- ණයට විකුණුම් - විකුණුම් ජ නලය
- ආපසු එවුම් - ආපසු එවුම් ජ නලය
- ණය ගැතියන්ගෙන් ලද මුදල් -මුදල් ලැබීම් ජ නලය
- දුන් වට්ටම් -මුදල් ලැබීම් ජ නලය
- බොල් ණය කපා හැරීම/පමා පොළී අයකිරීම/ දුන් වට්ටම් අහෝසි කිරීම/ප්‍රති පියවීම් - පොදු ජනලය

## ණයහිමි පාලන ගිණුම

කිසියම් ව්‍යාපාර ආයතනයක් සිය පොදු ලෙජරය ට අමතරව ණයහිමි ලෙජරයක් වෙනමම පවත්වාගෙන යන විට එම ණයහිමි ලෙජරයේ ඇති සියළුම ණයහිමි ගිනුම් වෙනුවෙන් පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන තනි ගිනුම **ණයහිමි පාලන ගිණුමයි.**

ණයහිමි පාලන ගිණුම වගකීම් පිළිබඳ මූලධර්මය අනුව සකස් කෙරේ.

එනම් ණයහිමි වටිනාකම වැඩිවීමට බලපාන ගනුදෙනු මෙම ගිණුමට බැර කරන අතර, ණය හිමි වටිනාකම අඩු වීමට බලපාන ගනුදෙනු මෙම ගිණුමට හර කරනු ලැබේ.

ණයහිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය | **** | ශේෂය | *** |
| ආපසු යැවුම් | *** | ණයට ගැනුම් | *** |
| මුදල්/ චෙක්පත් මගින් ගෙවීම | *** | පමා පොලි | *** |
| ගෙවිය යුතු බිල් ප්‍රතිග්‍රහණය | **** | නිකුත් කළ චෙක් අගරු විම | *** |
| ලද වට්ටම් | ** | ලද වට්ටම් අහෝසි කිරීම | **** |
| ප්‍රති පියවීම | **** | | |
| ගෙවිය යුතු බිල් අගරු වීම | *** | | |
| ශේෂය | **** | ශේෂය | **** |
| | ***** | | ***** |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

<u>ණයහිමි පාලන ගිණුම සැකසීම සඳහා තොරතුරු උපුටා ගන්නා මූලාශ්‍ර</u>

- ආරම්භක ණයහිමි ශේෂ - පොදු ජනලය
- ණයට ගැනුම් - ගැනුම් ජනලය
- ආපසු යැවුම් - ආපසු යැවුම් ජර්නලය
- ණයහිමියන්ට ගෙවූ මුදල් - මුදල් ගෙවීම් ජනලය
- ගෙවිය යුතු බිල් ප්‍රතිග්‍රහණය - පොදුජනලය
- ලද වට්ටම් - මුදල් ගෙවීම් ජනලය

**අභ්‍යාසය 1.**

සඳුනිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදු වූ පහත ගනුදෙනු සැලකිල්ලට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(රු)

| ණයගැතියා | 2017/1/1 ශේෂය | මුළු විකුණුම් | ණයට විකුණුම් මුළු විකුණුම්වලින් | ආපසු එවුම් | ලද මුදල | දුන් වට්ටම් |
|---|---|---|---|---|---|---|
| අෂේන් | 20 000 | 400 000 | 80% | 30 000 | 90 000 | 10 000 |
| රශිනි | 30 000 | 500 000 | 70% | 40 000 | 180 000 | 20 000 |
| පසිඳු | 40 000 | 600 000 | 50% | 30 000 | 180 000 | 20 000 |
| රවිඳු | (10 000) බැර | 700 000 | 60% | 20 000 | 300 000 | 20 000 |
| එකතුව | 80 000 | 2 200 000 | - | 120 000 | 750 000 | 70 000 |

අවශ්‍ය වන්නේ:

1. මුදල් ලැබීමේ ජ'ර්නලය, විකුණුම් ජ'ර්නලය, ආපසු එවුම් ජ'ර්නලය
2. පොදු ලෙජරයේ අදාළ ගිණුම්
3. ණයගැති උප ලෙජරයේ අදාළ ගිණුම් හා ශේෂ ලැයිස්තුව


Copyright © www.e-thaksalawa.moe.gov.lk